තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය

2.3

ප්‍රස්තුත වර්ග හඳුනා ගනිමින් ඒවා භාවිතා කරයි.



ඉගෙනුම් පල

⇒ වාක්‍ය හා ප්‍රස්තුත අතර වෙනස හඳුනා ගනී.

⇒ ප්‍රස්තුත වර්ග කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

⇒ නිරුපාධික ප්‍රස්තුත ඇසුරින් පද ව්‍යාප්තිය භාවිත කරයි.

⇒ වාක්‍ය නිරුපාධික ස්වරූපයට ගොඩ නඟයි.

⇒ විවිධ ප්‍රකාශනවල තාර්කික ස්වභාවය අගයයි.

අන්තර්ගතය සකස් කිරීම : අනූෂා නන්දනසිංහ මිය, ර/ සීවලී මධ්‍ය විද්‍යාලය , රත්නපුර
පරිගණක පිටු සැකසුම : එම්.වී.ජී.එස්.පී.බණ්ඩාර , මහ/ සේනාධිකාරී ජාතික පාසල,උඩහේන්තැන්න
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණීත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි

Copyright © www.e-thaksalawa.moe.gov.lk

2.3 ප්‍රස්තුත වර්ගීකරණය

නිගාමී පද්ධති යටතේ හැඳෑරීමට ලක්වන සම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රය. (ඇරිස්ටෝටලියානු තර්කය) නූතන වර්ග තර්කය සහ ප්‍රස්තුතමය තර්කය තුළ විවිධ ස්වරූපයේ ප්‍රස්තුත දැකගත හැකිය. ඒ අනුව,

1. සත්‍යතාවය පදනම් වූ ප්‍රස්තුත වර්ගීකරණය.
2. තාර්කික සම්බන්ධතා මත පදනම් වූ ප්‍රස්තුත වර්ගීකරණය
3. ප්‍රමාණය හා ගුණය මත පදනම් වූ ප්‍රස්තුත වර්ගීකරණය
4. ප්‍රස්තුත කලනයට පදනම් වූ ප්‍රස්තුත

1 සත්‍යතාවය මත පදනම් වූ ප්‍රස්තුත

සත්‍යතාවය

- අවශ්‍ය සත්‍ය/ අසත්‍ය
  - රූපික
  - විශ්ලේෂී
- සම්භාවිතාවයකින් යුතු සත්‍ය (අවිනිශ්චිත/ සංශ්ලේෂී)

අවශ්‍ය/ අනිවාර්ය සත්‍ය ප්‍රස්තුතය දරණ රූපය හෝ පදවල අර්ථය මත පදනම් වේ.

රූපික වශයෙන් සත්‍ය/ අසත්‍ය වන ප්‍රස්තුතය

උදා - 1. මොනාලිසා එක්කෝ නිළියකි. නැත්නම් නිළියක් නොවේ.

2. පෘථිවිය චලිත වීමත් චලිත නොවීමත් එකවිට සිදුවිය නොහැක.

3. පෘථිවිය ගෝලාකාර නම් හා නම් පමණක් පෘථිවිය ගෝලාකාර නොවේ.

4. නීතිය යුක්ති සහගත වීමත් යුක්ති සහගත නොවීමත් එකවර සිදුවෙයි.

මෙහි 1,2 ප්‍රස්තුත රූපික වශයෙන් සත්‍ය වේ. 3,4 ප්‍රස්තුත රූපිකව අසත්‍යය.

අන්තර්ගතය සකස් කිරීම : අනුෂා නන්දනසිංහ මිය, ර/ සීවලී මධ්‍ය විද්‍යාලය , රත්නපුර
පරිගණක පිටු සැකසුම : එම්.වී.ජී.එස්.පී.බණ්ඩාර , මහ/ සේනාධිකාරී ජාතික පාසල,උඩහේන්තැන්න
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණිත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි
Copyright © www.e-thaksalawa.moe.gov.lk

ප්‍රස්තුතයක විශ්ලේෂිභාවය එහි යෙදෙන පදවල අර්ථ මත රඳා පවතී. වාච්‍යයේ අර්ථය සමඟ වාචකය පෑහීමක් (අනුසන්ධාන බවක්) ඇත්නම් එය විශ්ලේෂි වශයෙන් සත්‍යය.

වාච්‍යයේ අර්ථයට වාචකය නොපෑහීමක් (විසංවාදයක්) දරයි නම් එය විශ්ලේෂි වශයෙන් අසත්‍යය. ඒවා විසංවාදි ප්‍රස්තුත යි.

උදා - 5. පංචාස්‍රය පාද පහක් ඇති තල රූපයකි.

6. අවිවාහකයා තනිකඩයෙකි.

7. ගොළුවා කතා කරයි.

8. වඳ කත දරුවෙකු වැදුවාය.

මෙහි 5,6 ප්‍රස්තුත විශ්ලේෂි වශයෙන් සත්‍යය. ඒවා පුනරුක්තීන්ය. 7,8 ප්‍රස්තුත විශ්ලේෂි වශයෙන් අසත්‍ය හෙවත් විසංවාදිය.

ප්‍රස්තුතයක් සත්‍ය හෝ අසත්‍ය වන්නේ බාහිර ලෝකයේ සිද්ධි වාචක තත්වයන්ට දක්වන අනුරූපතාවය මත නම් ඒවා සංස්ලේෂි ප්‍රස්තුත යි.

උදා - 9. කොළඹ ශ්‍රී ලංකාවේ අගනුවරයි.

10. සිංහයා සිව්පාවෙක් නොවේ.

11. පිදුරුතලාගල ලොව උසම කන්දය.

12. වසර 2020 අවසන් වීමට පෙර ශ්‍රී ලංකාවේ මධ්‍යම අධිවේගී මාර්ගයක් ඉදිකිරීම අවසන් වෙයි.

ඉහත 9 වන ප්‍රස්තුතය පවතින තත්ත්වයන්ට අනුරූපව සත්‍ය වේ. (සංස්ලේෂි සත්‍ය) 10 හා 11 වන ප්‍රස්තුත සංස්ලේෂි වශයෙන් අසත්‍යය. 12 ප්‍රස්තුතය සංශ්ලේෂි වශයෙන් සත්‍ය හෝ අසත්‍ය විය හැකිය. ඉහත ප්‍රස්තුත (9 - 12 දක්වා) අවශ්‍ය හෝ අනිවාර්ය තත්ත්වයන් නොව සම්භාවිතාවයෙන් යුතු තත්ත්වයන් පමණි. එහෙයින් ඒවා අවිනිශ්චිත ප්‍රස්තුත යනුවෙන්ද නම් කෙරේ.

අන්තර්ගතය සකස් කිරීම : අනූෂා නන්දනසිංහ මිය, ර/ සීවලී මධ්‍ය විද්‍යාලය , රත්නපුර
පරිගණක පිටු සැකසුම : එම්.වී.ජී.එස්.පී.බණ්ඩාර , මහ/ සේනාධිකාරී ජාතික පාසල,උඩහේන්තැන්න
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණිත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි
Copyright © www.e-thaksalawa.moe.gov.lk

තාර්කික සම්බන්ධය මත පදනම් වූ ප්‍රස්තුත

ප්‍රස්තුතයක අංග අතර පවතින තාර්කික සම්බන්ධතාවයන් සැළකිල්ලට ගෙන ප්‍රස්තුත වර්ග 3 කි.

1. නිරුපාධික ප්‍රස්තුත
2. සෝපාධික ප්‍රස්තුත
3. වියෝජක ප්‍රස්තුත

නිරුපාධික ප්‍රස්තුත

වාච්‍ය උදෙසා වාචකය ස්වාධීනව (කොන්දේසි විරහිතව) අස්ත්‍යාර්ථයේ (ඇත යන අර්ථය) හෝ නාස්ත්‍යාර්ථයේ (නැත යන අර්ථය) ප්‍රනිශ්චයක් කෙරේ නම් ඒවා නිරුපාධික ප්‍රස්තුත වේ.

උදා - 1. සියලුමිනිසුන් මැරෙන සුළුය.

2. කිසිම උරගයෙක් ක්ෂීරපායි සත්වයෙකු නොවේ.

3. සර්පයින් අතර විසකුරු අය සිටී.

4. දිළිසෙන සියල්ල රත්‍රං නොවේ.

5. රාමා ශිෂ්‍යයෙකි.

6. මේ පොත නවකථාවක් නොවේ.

මේවා සර්වවාචී, ඒකාධිවාචී, ඒකවාචී යන ප්‍රභේදයන්ට අයත්ය. වාච්‍යයේ වස්තු අර්ථය සපුරා (මුළුමනින්ම) වාචකය මඟින් කරනු ලබන ප්‍රනිශ්චයට යටත් වේ නම්, සර්වවාචී ප්‍රස්තුතයකි.

ඒ අනුව ඉහත 1. සර්වවාචි ප්‍රතිජානන වන අතර

2. සර්වවාචී ප්‍රතිශේධන වේ.

වාචකයෙන් දැක්වෙන ප්‍රනිශ්චයට යටත් වන්නේ වාච්‍ය තුළ ඇතුළත් වස්තූන්ගෙන් කොටසක් නම් එය ඒකාධිවාචී අර්ථය ගනී.

ඒ අනුව 3. ඒකාධිවාචී ප්‍රතිජානන ලෙසත්

4. ඒකාධිවාචී ප්‍රතිශේධන ලෙසත් සැළකේ.

වාච්‍ය නිශ්චිත එක් වස්තුවක් උද්දිෂ්ට කෙරෙන විටදී ඒකවාචී අර්ථයට ගනී.

ඒ අනුව ඉහත 5. ඒකවාචී ප්‍රතිජානන ප්‍රස්තුතයක් වන අතර 6. ඒකවාචී ප්‍රතිශේධන ප්‍රස්තුතයක් වේ.

අන්තර්ගතය සකස් කිරීම : අනුෂා නන්දනසිංහ මිය, ර/ සීවලී මධ්‍ය විද්‍යාලය , රත්නපුර
පරිගණක පිටු සැකසුම : එම්.වී.ජී.එස්.පී.බණ්ඩාර , මහ/ සේනාධිකාරී ජාතික පාසල,උඩහේන්තැන්න
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණීත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි
Copyright © www.e-thaksalawa.moe.gov.lk

සෝපාධික ප්‍රස්තුත

ප්‍රස්තුතයක පූර්වාංගය, එහි අපරාංගයේ සෑහෙන හේතුවක් හෝ අවශ්‍ය හේතුවක් ලෙස දක්වන ප්‍රස්තුත සෝපාධික අර්ථය ගනී.

උදා - 1. ඉදිරි මාර්තු මාසයට පෙර වැසි ඇතිවේ නම් අප්‍රේල් මාසයේදී කුඹුරු වැපිරේ.

2. නොකඩවා වැසි ඇතිවේ නම් පමණක් ජලාශය පිටාර ගලයි.

මෙහි 1 වැන්නේ සෑහෙන හේතුවක් දක්වන අතර 2 වැන්නේ අවශ්‍ය හේතුවක් දැක්වේ.

වියෝජක ප්‍රස්තුත

සමන්විත අංග විකල්ප අවස්ථා ලෙස ඉදිරිපත්ව ඇති වාක්‍ය වියෝජක අර්ථය ගනී. සාමාන්‍ය ව්‍යවහාරයේදී හෝ , එක්කෝ .... නැත්නම්, නැතහොත් වැනි පද භාවිතයෙන් විකල්ප දැක්වේ.

උදා - 1. විත්තිකරු හෝ සාක්ෂිකරු වැරදිකරුය.

2. එක්කෝ නීතිය යුක්ති සහගතය, නැත්නම් විනිශ්චය සාධාරණය.

3. ඔහු 5 වන ප්‍රශ්නය නැත්නම් 6 වන ප්‍රශ්නය තෝරා ගනී.

වියෝජක අර්ථය තාර්කිකව , 1. දුබල වියෝජක

2. ප්‍රබල වියෝජක

වශයෙන් ප්‍රභේද වේ. දී ඇති විකල්ප අතරින් අඩු තරමින් එකක් හෝ සත්‍ය වේ යන අර්ථය දුබල වියෝජකයයි. ඉහත 1,2,3 වාක්‍ය ඒ අර්ථයෙන් දුබල වියෝජක වේ.

ප්‍රබල වියෝජක අර්ථය වන්නේ දෙන ලද විකල්ප අතරින් එකක් හා එකක් පමණක් සත්‍ය වේ යන්නයි.

උදා - 4. විත්තිකරු සහ සාක්ෂිකරු යන දෙදෙනාගෙන් එක් අයකු හා එක් අයකු පමණක් වැරදිකරුය.

අන්තර්ගතය සකස් කිරීම : අනූෂා නන්දනසිංහ මිය, ර/ සීවලී මධ්‍ය විද්‍යාලය , රත්නපුර
පරිගණක පිටු සැකසුම : එම්.වී.ජී.එස්.පී.බණ්ඩාර , මහ/ සේනාධිකාරී ජාතික පාසල,උඩහේන්තැන්න
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණීත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි
Copyright © www.e-thaksalawa.moe.gov.lk

ප්‍රමාණය සහ ගුණය මත පදනම් වූ ප්‍රස්තුත වර්ගීකරණය

ප්‍රස්තුතයක ප්‍රමාණය වාච්‍යයේ වස්තු අර්ථය හා බැඳෙන අතර ගුණය වාචකයේ ප්‍රනිශ්චිත අර්ථය සමඟ බැඳේ. එවිට ප්‍රමාණය හා ගුණය මත පදනම් වූ ප්‍රස්තුත වර්ග 4කි.

1. සර්වවාචී ප්‍රතිජානන (සාමාන්‍ය ප්‍රතිජානන) - A
2. සර්වවාචී ප්‍රතිශේධන (සාමාන්‍ය ප්‍රතිශේධන) - E
3. ඒකාධිවාචි ප්‍රතිජානන (විශේෂ ප්‍රතිජානන) - I
4. ඒකාධිවාචි ප්‍රතිශේධන (විශේෂ ප්‍රතිශේධන) - O

ඉහත වර්ග හැඳින්වීමට යොදා ඇති A,E,I,O යන අක්ෂර සම්මත ඒවාය.

සර්වවාචී ප්‍රතිජානන ප්‍රස්තුත (A)

වාච්‍ය වර්ගයට අයත් සියලු වස්තූන් මෙන්ම එක් වස්තුවක් උදෙසාත් වාචකයෙන් අස්ත්‍යාර්ථයේ ප්‍රනිශ්චයක් කරන විටදී සර්වවාචී ප්‍රතිජානන (A) ප්‍රස්තුතයක් ලෙස ගැනේ.

උදා - 1. සියලු මිනිස්සු මැරෙන සුළුය.

2. කපුටා කළුපාටය.

3. හැම දාර්ශනිකයෙක්ම ප්‍රඥාවන්තයන්ය.

4. සිව්පාවෙක් නම් ක්ෂීරපායි වේ.

සර්වවාචී ප්‍රතිශේධන ප්‍රස්තුත (E)

වාච්‍ය වර්ගයට අයත් සියලු වස්තූන් උදෙසා පදාභිධේයයෙන් (වාචකයෙන්) නාස්ත්‍යාර්ථයේ ප්‍රනිශ්චයක් කෙරේ නම් සර්වවාචී ප්‍රතිශේධන ප්‍රස්තුතයක් ලෙස ගැනේ.

උදා - 1. කිසිම උරගෙක් ක්ෂීරපායි නොවේ.

2. මිනිසුන් අවංක නැත.

3. යටත් පිරිසෙයින් එක උරගෙකුවත් විසකුරු නොවේ.

4. රජෙක් නීච වැඩ නොකරයි.

අන්තර්ගතය සකස් කිරීම : අනුෂා නන්දනසිංහ මිය, ර/ සීවලී මධ්‍ය විද්‍යාලය , රත්නපුර
පරිගණක පිටු සැකසුම : එම්.වී.ජී.එස්.පී.බණ්ඩාර , මහ/ සේනාධිකාරී ජාතික පාසල,උඩහේන්තැන්න
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණීත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි
Copyright © www.e-thaksalawa.moe.gov.lk

ඒකාධිවාචී ප්‍රතිජානන ප්‍රස්තුත (I)

වාච්‍ය වර්ගයට අයත් වස්තූන්ගෙන් සමහර වස්තූන් උදෙසා (එකකට වැඩි වස්තු ගණනක්) වාචකය අස්ත්‍යාර්ථයේ ප්‍රනිශ්චයක් කරයි.

උදා - 1. සමහර සිව්පාවුන් මාංශභක්ෂකය.

2. ඇතැම් පාලකයන් ඒකාධිපති වේ.

3. පමණක් උරගුන් විසකුරුය.

4. අඩු තරමින් එක මිනිහෙක්වත් වයස අවුරුදු 60 කට වඩා වැඩිය.

ඒකාධිවාචී ප්‍රතිශේධන ප්‍රස්තුත (0)

වාච්‍ය වර්ගයට අයත් වස්තූන්ගෙන් සමහර වස්තූන් උදෙසා වාචකය නාස්ත්‍යාර්ථයේ ප්‍රනිශ්චයක් කරයි.

උදා - 1. සමහර මල් රතුපාට නොවේ.

2. දිලිසෙන සියල්ල රත්‍රං නොවේ.

3. හැම උගතෙක්ම බුද්ධිමත් විය නොහැක.

4. අඹවලින් කීපයක් හෝ ඉදී නැත.

<u>වර්ග ප්‍රස්තුතයක් ලෙස සම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රය සැළකිල්ලට ගන්නා **A,E,I,O** යන ප්‍රස්තුතයන්හි පද ව්‍යාප්තිය.</u>

ප්‍රස්තුතයක යෙදෙන පදයක් එහි වස්තු අර්ථය සපුරා ඒ යටතට ගනී නම් එය ව්‍යාප්ත අර්ථය ගනී. ඒ අනුව ඉහත දැක්වූ සර්වවාචී (සාමාන්‍ය) ප්‍රස්තුතයන්හි (A හා E) වාච්‍ය ව්‍යාප්ත අර්ථය ගන්නා අතර ප්‍රතිශේධන ප්‍රස්තුතයන්හි (E හා O) වාචකය (පදාභිධේය) ව්‍යාප්ත වේ.

පදයක් ඊට අයත් වස්තූන්ගෙන් කොටසකට පමණක් සීමාවේ නම් එය අව්‍යාප්ත අර්ථය ගනී. ඒ අනුව ඒකාධිවාචී ප්‍රස්තුතයන්හි (I හා O) වාච්‍ය පදය සහ ප්‍රතිජානන ප්‍රස්තුතයන් හි (A හා I) වාචකය අව්‍යාප්ත වේ.

අන්තර්ගතය සකස් කිරීම : අනුෂා නන්දනසිංහ මිය, ර/ සීවලී මධ්‍ය විද්‍යාලය , රත්නපුර
පරිගණක පිටු සැකසුම : එම්.වී.ජී.එස්.පී.බණ්ඩාර , මහ/ සේනාධිකාරී ජාතික පාසල,උඩහේන්තැන්න
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණීත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි
Copyright © www.e-thaksalawa.moe.gov.lk

මෙහිදී ව්‍යාප්ත පදය + සලකුණින් ද අව්‍යාප්ත පදය - සලකුණින් ද සංකේතවත් කළ විට A,E,I,O යන ප්‍රස්තුතයන්හි පද ව්‍යාප්තිය මෙසේ දැක්විය හැකිය.

ප්‍රස්තුතය	පද ව්‍යාප්තිය	
	වාච්‍ය(S)	පදාභිධේය (වාචකය) (P)
සර්වවාචී ප්‍රතිජානන (A)	ව්‍යාප්තයි (S^+)	අව්‍යාප්තයි (P^-)
සර්වවාචී ප්‍රතිශේධන (E)	ව්‍යාප්තයි (S^+)	ව්‍යාප්තයි (P^+)
ඒකාධිවාචී ප්‍රතිජානන (I)	අව්‍යාප්තයි (S^-)	අව්‍යාප්තයි (P^-)
ඒකාධිවාචී ප්‍රතිශේධන (0)	අව්‍යාප්තයි (S^-)	ව්‍යාප්තයි (P^+)

ප්‍රස්තුත කලනයට පදනම් වූ ප්‍රස්තුත

සාම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රයෙන් බැහැරට යන නූතන තර්ක ශාස්ත්‍රය වාක්‍ය අතර සම්බන්ධතා නිරූපණය කරයි. ප්‍රස්තුත කලනය ලෙස හැඳින්වෙන්නේ සරල වාක්‍ය ඇසුරින් ගොඩ නැඟුණු සංකීර්ණ වාක්‍ය මත පදනම් වූ තර්කයයි.

සරල වාක්‍ය හා සංයුක්ත වාක්‍ය

ප්‍රස්තුත කලනයේ සරල වාක්‍යක පහත ලක්ෂණ ඇතුළත්ය.

1. වාච්‍ය තුළ ප්‍රමාණ ලක්ෂණයක් නොදැරීම.
2. නිශේධන අර්ථයක් නොදැරීම.
3. සමන්විත අංග තවදුරටත් විභජනය කළ නොහැකි වීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

පහත සඳහන් වාක්‍ය දෙස බලමු.

උදා - 1. සියලු සිංහයින් නිර්භීතය.

2. සමහර පලතුරු ඇඹුල් රසය.

3. බල්ලා සිව්පාවෙකි.

4. මොනාලිසා නිළියක් නොවේ.

5. හතර ප්‍රථමක සංඛ්‍යාවකි යන්න අසත්‍යය.

6. දුන්හිඳ මෙන්ම දියළුම දිය ඇල්ලකි.

7. කමල් නීතිඥයෙක් වන අතර පියල් වෛද්‍යවරයෙකි.

ඉහත 1,2 ප්‍රස්තුතයන්හි වාච්‍ය සෘජුවම ප්‍රමාණ ලක්ෂණයක් දරණ අතර 3 වැන්න තුළ ප්‍රමාණ ලක්ෂණයක් අඟවයි. එබැවින් ඒවා සරල වාක්‍ය නොවේ. 4 වන හා 5 වන වාක්‍ය නිශේධන අර්ථයක් දරයි. 6 වෙනි සහ 7 වෙනි වාක්‍ය නැවත විභජනය කළ හැකි වාක්‍යය. එබැවින් 1,7 දක්වා වූ වාක්‍ය සරල වාක්‍ය නොවේ.

8. අධිකරණය ස්වාධීනය.

9. ඇතැන්ස් ග්‍රීසියේ අගනුවරයි.

10. X ට වඩා Y විශාල වේ.

මෙහි 8,9,10 වාක්‍ය සරල වාක්‍ය වනු ඇත. ප්‍රස්තුත කලනයේ මෙවැනි සරල වාකය සඳහා P,Q,R,S .... Z දක්වා වූ විචල්‍ය යොදා ගනී.

සරල ප්‍රස්තුත (පරමාණුක ප්‍රස්තුත) එක්වීමෙන් සංයුක්ත (සංකීර්ණ) ප්‍රස්තුත ගොඩනැගේ. පුස්තුත කලනයේදී එවැනි සංයුක්ත ප්‍රස්තුත කිහිපයක් දැකගත හැකිය.

1. සංයෝජක ප්‍රස්තුත
2. ගම්‍ය ප්‍රස්තුත
3. උභය ගම්‍ය ප්‍රස්තුත
4. වියෝජක ප්‍රස්තුත

Copyright © www.e-thaksalawa.moe.gov.lk

Copyright © www.e-thaksalawa.moe.gov.lk

සංයෝජක ප්‍රස්තුත

වාක්‍ය සහ සම්බන්ධතා නිපාත මඟින් සංයුක්ත වන විටදී සංයෝජන වාක්‍ය ගොඩනැගේ.

P: නීතිය යුක්ති සහගතය

Q: විනිශ්චය සාධාරණය

ඉහත සරල වාක්‍ය ඇසුරින් පහත දැක්වෙන ආකාරයේ සංයෝජක වාක්‍ය ගොඩනඟා ගත හැකිය. එහිදී වාක්‍ය සම්බන්ධක ලෙස සහ, මෙන්ම, අතර, ද,ත්, වුවත්, වුවද, නමුත් වැනි නිපාත යෙදේ. ඒවා වෙනුවෙන් සංයෝජක (^) සංකේතය යෙදේ. නැත යන අර්ථය (නිශේධන අර්ථය) දැක්වීමේදී '~' සංකේතය නියති පදයක් ලෙස යෙදේ.

සංක්ෂේපණ රටාව : P - නීතිය යුක්ති සහගතය

Q - විනිශ්චය සාධාරණය

ඒ අනුව,

1. නීතිය යුක්ති සහගත මෙන්ම විනිශ්චය සාධාරණය

මේ ප්‍රකාශනය (P ∧ Q) වශයෙන් සංකේතවත් වේ.

ඒ අනුසාරයෙන් පහත එක් එක් ප්‍රකාශනයේ සංකේතකරණයන් මෙසේ වේ.

2. නීතිය යුක්ති සහගත නමුත් විනිශ්චය සාධාරණ නොවේ. (P ∧ ~ Q)

3. නීතිය යුක්ති සහගත නැතත් විනිශ්චය සාධාරණය.(~ P ∧ Q)

4. නීතිය යුක්ති සහගතවත් විනිශ්චය සාධාරණවත් නොවේ.(~ P ∧ ~ Q)

5. නීතිය යුක්ති සහගත සහ විනිශ්චය සාධාරණ යන දෙකම විය නොහැක.

~ (P ∧ Q)

ගම්‍ය ප්‍රස්තුත (→)

පූර්ව සිද්ධිය අපර සිද්ධියේ සෑහෙන හේතුවක් ලෙස දැක්වීමට යොදා ගන්නා නම්, නිසා, හෙයින්, බැවින්, හොත් වැනි හේතුකාරක නිපාතයක් මඟින් ගම්‍ය අර්ථය ප්‍රකාශ වේ. ගම්‍ය (→) සංකේතය මඟින් දැක්වේ.

උදා - P : කාලගුණය යහපත්ය

Q : ක්‍රීඩා තරඟය අස්ගිරිය ක්‍රීඩාංගනයේදී පැවැත්වේ.

1. ඉදින් කාලගුණය යහපත් නම් ක්‍රීඩා තරඟය අස්ගිරිය ක්‍රීඩාංගනයේදී පැවැත්වේ.

(P → Q)

2. ඉදින් කාලගුණය යහපත් නොවුනහොත් ක්‍රීඩා තරඟය අස්ගිරිය ක්‍රීඩාංගනයේදි නොපැවැත්වේ.

(~ P → ~ Q)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

උභයගම්‍ය ප්‍රස්තුත (↔)

පූර්ව සිද්ධිය අපර සිද්ධිය වෙනුවෙන් සෑහෙන මෙන්ම අවශ්‍ය හේතුවක් ලෙස දැක්වීම උභයගම්‍ය අර්ථය ලෙස සැලකේ. නම් හා නම් පමණක් ,නිසා හා නිසාවෙනි, හොත් හා හොත් පමණක් වැනි පද මගින් වාක්‍ය සම්බන්ධ කෙරේ.

උදා - 1. පෘථිවිය චන්ද්‍රයාට වඩා විශාල නම් හා නම් පමණක් චන්ද්‍රයා පෘථිවිය වටා ගමන් ගනී.

P : පෘථිවිය චන්ද්‍රයාට වඩා විශාලය.

Q : චන්ද්‍රයා පෘථිවිය වටා ගමන් ගනි.

(P ↔ Q)

2. පෘථිවිය චන්ද්‍රයාට වඩා විශාල නොවුනහොත් හා එසේ නොවුනහොත් පමණක් චන්ද්‍රයා පෘථිවිය වටා ගමන් නොගනී.

(~ P ↔ ~ Q)

වියෝජක ප්‍රස්තුත (v)

ප්‍රස්තුතයක සත්‍යතාවය එහි දක්වන විකල්ප අවස්ථාවන්ගේ සත්‍යතාවය මත රඳන ප්‍රස්තුත වියෝජක අර්ථය ගනි.

හෝ, එක්කෝ, නැත්නම්, නැතහොත්, නම්මිස, යටත්පිරිසෙයින් එකක්වත් වැනි සම්බන්ධක මඟින් වියෝජක අර්ථය ප්‍රකාශ වේ.

දුබල වියෝජක අර්ථය සහ ප්‍රබල වියෝජක අර්ථය ලෙස එහි ප්‍රභේද දෙකකි.

ප්‍රකාශනය සත්‍ය වීමට අඩු තරමින් එහි එක් විකල්පයක් හෝ සත්‍ය වීම ප්‍රමාණවත් නම් එය දුබල වියෝජකය ලෙස සැලකේ. ‘ v ’ සංකේතය ඒ සඳහා යෙදේ.

උදා - P: තර්ක ශාස්ත්‍රය පහසුය.

Q : ගණිතය පහසුය.

1.තර්ක ශාස්ත්‍රය හෝ ගණිතය පහසුය. (P v Q)

2.එක්කෝ තර්ක ශාස්ත්‍රය පහසු නැත. නැත්නම් ගණිතය පහසු නැත. (~P v~Q)

3.තර්ක ශාස්ත්‍රය පහසු නොවේ නම් මිස ගණිතය පහසුය. (~P v Q)

දී ඇති විකල්ප අතරින් එකක් හා එකක් පමණක් සත්‍ය වේ නම් එය ප්‍රබල වියෝජකයයි. (v̲)

උදා - 4.තර්ක ශාස්ත්‍රය හා ගණිතය යන දෙකෙන් එකක් හා එකක් පමණක් පහසුය. (P v̲ Q)

අන්තර්ගතය සකස් කිරීම : අනූෂා නන්දනසිංහ මිය, ර/ සීවලී මධ්‍ය විද්‍යාලය , රත්නපුර
පරිගණක පිටු සැකසුම : එම්.වී.ජී.එස්.පී.බණ්ඩාර , මහ/ සේනාධිකාරී ජාතික පාසල,උඩහේන්තැන්න
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණිත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි

Copyright © www.e-thaksalawa.moe.gov.lk